# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14.873/3 — 1969 සැප්තැම්බර් 29 වැනි සඳුදු — 1969.9.29

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

(i) පළාත් පාලන ආයතනවල වර්තමාන ආදායම් මාර්ගවල ප්‍රමාණවත් බව, රජයත් පළාත් පාලන ආයතනයත් අතර පවතින මුදල් සම්බන්ධතාව, පළාත් පාලන ආයතනවල කාර්යයන් මීට වඩා කාර්යක්ෂම අන්දමින් කිරීමට ඉඩ සැලසෙන පරිදි එම ආයතන වලට ලබා දිය යුතු නව ආදායම් මාර්ග කවරේද යන්න,

(ii) පළාත් පාලන ආයතන මීට වඩා කාර්යක්ෂම අන්දමින් ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන ආයතනවල නගරාධිපතිවරුන්/සභාපතිවරුන් තෝරා පත් කිරීමේ වර්තමාන ක්‍රමයෙහි සහ නගරාධිපතිවරුන්ගේ/සභාපති වරුන්ගේ බලතල සහ කාර්යවල සහ පළාත් පාලන ආයතන සමග ඔවුන්ගේ සම්බන්ධතාවයන් හී කිසියම් වෙනසක් කළ යුතු ද යන්න,

(iii) කාරක සභාව වෙත යොමු කෙරෙන කිසියම් වෙනත් කරුණු,

පිළිබඳව පරීක්ෂා කර බලා නිර්දේශයක් කිරීම සඳහා පහත නම් සඳහන් අයගෙන් සමන්විත කාරක සභාවක් පළාත් පාලන ගරු ඇමතිතුමා විසින් සතුටින් පත් කොට ඇත. ඒ අය නම් :—

(1) වී. සී. ජයසූරිය මහතා (සභාපති)

(2) ඩී. එස්. ද සිල්වා මහතා

(3) ආචාර්ය සී. එජ්. අමරසිංහ මහතා.

ඊ. ජී. ගුණවර්ධන,
ස්ථිර ලේකම්,
පළාත් පාලන අමාත්‍යාංශය.

1969 සැප්තැම්බර් මස 29 වැනි දින,
කොළඹ 1.

9–267


ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.

3A - —ජේ. 6864—5,375 (69/9)